**ශීර්ෂය - 248 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------------

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 27 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

------------------------------------------------------------

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂයේ අයවැයගත තොරතුරු ඉදිරිපත්කිරිමේදි ඇස්තමේන්තුගත රු 35,000,000 ක දුම්කොළ බදු ආදායම් පෙන්වා නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 248-1-1-0-1003-5/11 දිරිදිමනා වැය වැෂය සඳහා වෙන්කර තිබු මුදල රු.23,000,000 ක් වුවද රු.19,800,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන එයට ගලපා තිබීම හේතුවෙන් ඒ.සී.ඒ 2 ආකෘතිය, ඒ.සී.ඒ 2(i) ආකෘතිය, ඒ.සී.ඒ 2(ii) සහ ඒ.සී.ඒ 2(iii) ආකෘති වල ඇස්තමේන්තු ප්‍රතිපාදනය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අඩුවෙන්ද දැක්විණි. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් ඇති නොවීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක 06 දරන මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වලට අදාල 2021 අයවැය තොරතුරුවල එකතුව රු 2,000,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | -එම- |
| (ඈ) | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්වල අයවැයගත සංශෝධිත අගය වෙනුවට මුල් අගය දැක්වීම හේතුවෙන් රු.2,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව සටහන් කිරීමට උපදෙස් දෙන ලදි. | -එම- |

**1.6.2 ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ අපනයනය කරන ලද මත්පැන්වලට අදාල ආපසු ගෙවන ලද එකතුව රු. 3,689,638,848 ක බදු අවකරණයක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මත්පැන් අපනයන මත සුරාබදු අවකරණය කිරීම සම්බන්ධ තොරතුරු 2022 වර්ෂයේ සිට ගිණුම් අංශය මගින් ද ලේඛන ගත කර පවත්වාගෙන යාමට කටයුතු කෙරේ. බදු අවකරණය සම්බන්ධ ගිණුම් ක්‍රමවේදය පිළිබඳව අමාත්‍යාංශයේ උපදෙස් ඉල්ලා ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු කෙරේ. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

**1.6.3 දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ ශේෂය 1,458,969,403 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ඒ.සී.ඒ 06 ආකෘතියේ ආරම්භක ශේෂය රු. 1,458,163,819 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු 805,584 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 වාර්ෂික ගිණුම් සැකසීමේදී නිවැරදි ආරම්භක ශේෂය ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමට කටයුතු කෙරේ. | නිවැරදි ආරම්භක ශේෂය ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශනය සකස් කළ යුතුය. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා ඇප ආඥා පනත යටතේ ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන ඇති අතර එම නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. එම කටයුතු අවසන් වූ පසු ඇප ලේඛනය යාවත්කාලින කිරීමට කටයුතු කෙරේ | විධිවිධාන ප්‍රකාරව ඇප ලේඛනය යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මේ වන විට හානි පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ | විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 445 ප්‍රකාරව මත්පැන් නිෂ්පාදන ආදායම් බදු ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මේ වන විට යාවත්කාලීනව පවත්වාගෙන යාමට අදාල නිලධාරින් හට උපදෙස් ලබා දී ඇත. | විධිවිධාන ප්‍රකාරව යාවත්කාලින කර පවත්වා ගත යුතුය. |
| (ඈ) | මුදල් රෙගුලාසි 445 ප්‍රකාරව මත්පැන් අපනයන මත බදු අවකරණ සම්බන්ධ තොරතුරු සටහන් කිරීමට ලේඛනයක් පවත්වා නොතිබුණි | 2022 වසරේ සිට අවශ්‍යතාවය පරිදි මෙම ලේඛනය පවත්වාගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 445 ප්‍රකාරව ලේඛනය පවත්වාගත යුතුය. |

1.6.5 **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

**-------------------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සුරාබදු දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රමවේද ස්ථාපිත කර අවශ්‍ය අවස්ථාවන්හීදී කලින් කලට සමාලෝචනය කරමින් සඵලදායීව සිදුකරගෙන යනු ලබන බවත්, මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යන බවටත් 2021 මැයි 07 දින විගණකාධිපති වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | -එම- |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත සුරාබදු ආදායම රු. බිලියන 160 ක් විය. කොවිඩ් එන්නත්කරණය, සංචාරක ව්‍යාපාරය කඩා වැටීම සහ නිෂ්පාදන ආයතන වසා දැමීම යන කරුණු හේතුවෙන් රු. බිලියන 27 කින් ආදායම් අහිමිවීමක් සිදුවී තිබුණ බවට දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර තිබුණි. තවද දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉලක්කය රු. බිලියන 160 සිට 135 දක්වා රු. බිලියන 25 කින් හෙවත් සියයට 15.62 කින් සංශෝධනය කිරීම සඳහා 2021 ඔක්තෝම්බර් මස 28 දින ඉල්ලුම්කර තිබූ අතර ඒ අනුව සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු. බිලියන 140 ක් වී රු. බිලියන 138 ක ආදායමක් රැස්කර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මත්පැන් නිෂ්පාදනාගාර වසා දැමීම නිසා අපේක්ෂිත ආදායම් ඉලක්ක කරා ලඟාවීමට නොහැකිවීම මත ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. | ආදායම් ඇස්තමේන්තු ප්‍රකාරව ආදායම් අයකර ගැනීමට උපරිම උත්සාහය දැරිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව එක් එක් නිෂ්පාදනාගාර වෙත මාසික පදනමින් ලබා දී තිබුණු ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධව සිදු කළ නියැදි පරීක්ෂාවේදී ආයතන 04 ක් පමණක් සියයට 03 සිට 28 දක්වා පරාසයකින් ඉලක්කගත ආදායම් සීමාව ඉක්මවා තිබුණු බව නිරීක්ෂණය විය. ආයතන 14 ක් සියයට 10 සිට 68 ත් අතර පරාසයකින් ඉලක්ක සපුරා නොතිබූ අතර ඉන් ආයතන 09 ක්ම සියයට 30 ක වැඩි ප්‍රතිශතයකින් ඉලක්ක සපුරා නොතිබුණි. මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධව Zoom තාක්ෂණය ඔස්සේ නිලධාරීන් හා ආයතනය සමඟ සම්බන්ධ වෙමින් අවශ්‍ය උපදෙස් හා නියෝග ලබා දී ඇත. වරින් වර ලිඛිතව උපදෙස් හා නියෝග ලබා දී ඇත. නිෂ්පාදනාගාරවල පැවති ප්‍රයෝගික ගැටළු හා කළමානකරණ තීරණ හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම ඉලක්ක ලගා කර ගැනීමේ දුෂ්කරතා පැන නැගුණි. | ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධව දත්ත තොරතුරු විශ්ලේෂණාත්මකව විග්‍රහ කරමින් අදාල ඉලක්කයන් සපුරා ගැනීමට නිෂ්පාදනාගාර යොමු කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ බොතල් රා නිෂ්පාදනාගාර 44 ක් ක්‍රියාත්මකව පැවති අතර පොල් රා බෝතල් නිෂ්පාදනාගාර 11 කින් රු. 66,618,289 ක් හා තල් රා බෝතල් නිෂ්පාදනාගාර 22 කින් රු 20,536,816 ක් වශයෙන් එකතුව රු. 87,155,105 ක මුළු ආදායමක් උපයා තිබුණි. තවද පොල් රා නිෂ්පාදනාගාර 5 ක් සහ තල් රා නිෂ්පාදනාගාර 6 ක් | 2021 වර්ෂයේ යාවත්කාලීන කර තිබුණේ පොල් රා නිෂ්පාදනාගාර 05 ක් හා තල් රා නිෂ්පාදනාගාර 03 ක් පමණි. දීර්ඝ කාලයක් නිෂ්පාදන කටයුතු සිදු නොකර සිටින ආයතන පරීක්ෂා කර බලා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත. | අක්‍රීය තත්වයේ පැවති නිෂ්පාදනාගාර පිළිබඳව කරුණු සොයාබලා ක්‍රියාකාරී මට්ටමට පත් කිරීම මගින් නිෂ්පාදන බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීය තත්වයේ පැවතීම හේතුවෙන් එම නිෂ්පාදනාගාරවලින් ලැබිය යුතු බෝතල් රා නිෂ්පාදන බදු ආදායම අහිමි වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව මත්පැන් නිෂ්පාදන ආයතන වෙතින් රු. 4,537,361,087 ක්ද, රා නිෂ්පාදන ආයතන වෙතින් රු. 857,186 ක්ද, ස්කාගාර වෙතින් රු. 12,455,210 ක්ද වශයෙන් මුළු හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු. 4,550,673,483 ක් සුරාබදු දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව පැවතිණි. එය 2020 වසර සඳහා වූ හිඟ ආදායම සමග සැසඳීමේදි සියයට 14.63 ක වැඩි වීමක් බව නිරීක්ෂණය විය. | ප්‍රමාදය සඳහා මසකට 3% ක ප්‍රමාද ගාස්තුවක් අය කෙරේ. ඒ අනුව 2020 වසරේ හිඟ බදු මුදල් සඳහා දඩ මුදල් මෙන්ම 2021 වසරේ හිඟ බදු මුදල් හා දඩ මුදල්ද ඇතුලත්ව ඇති බැවින් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වසර 5 කට වැඩි කාලයක් තුල අයකරගත නොහැකිවූ ආයතන 05 කට අදාල හිඟ බදු මුදල රු. 360,625,439 ක් වු අතර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා වූ ප්‍රමාද ගාස්තු රු. 1,724,514,749 ක්ද ඇතුළුව එකතුව රු. 2,085,140,188 ක ආදායමක් අයකර ගැනිමට නොහැකි වී තිබුණි. ඉන් ආයතන 03 කට අදාලව නඩු පැවරීමට අවශ්‍ය මූලික කරුණු කෙටුම්පත් කරන අවස්ථාවේදී හිඟ සුරාබදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පිළිබඳ එකඟතාවය ඇතිකරගෙන තිබුණද අදාළ ආයතනයන් විසින් එම එකඟතාවයන් කඩ කර හිඟ බදු හා ප්‍රමාද ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණි. | හිඟ බදු අයකර ගැනීම සඳහා සමාගම් දෙකකට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාග වෙමින් පවතින අතර, අනෙක් සමාගම් තුන සඳහා අධිකරණයේ නඩු පැවරීමට අවශ්‍ය මූලික කටයුතු දැනට මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් සිදුකරමින් පවති. | -එම- |
| (ඊ) | නිෂ්පාදන කටයුතු අත්හිටුවා ඇති සමාගමකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු. 1,248,194,257 ක් වු අතර ඒ සඳහා වු ප්‍රමාද ගාස්තු රු. 793,225,429 ක් විය. අදාළ සමාගම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා මූලිකව රු. 100,000,000 ක් ගෙවීමටත් ඉතිරිය වාරික 24 කින් ගෙවීම සඳහාත් 2021 ජුනි 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ඉන් මූලික ගෙවීම වාරික 02 ක් යටතේත් ඉන් පළමු වාරිකය 2021 ජුනි 30 දින ගෙවීමටත් කටයුතු ආරම්භ කර තිබුණද | අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. ඒ අනුව මෙම ආයතනයෙන් අයවිය යුතු ඉතිරි හිඟ බදු මුදල්, ප්‍රමාද ගාස්තු හා මුද්දර ගාස්තු සියල්ල අයකර ගැනීම සඳහා නිතීමය පියවර ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සුරාබදු දෙපාර්තමේන්තුවේ නීති අංශය විසින් සිදුකරමින් පවති | -එම- |

| | | | |
|---|---|---|---|
| | අමාත්‍ය මණ්ඩල තීරණයක් මත නැවත නිෂ්පාදන බලපත්‍ර අත්හිටුවීමට කටයුතු කර තිබුණි. | | |
| ( උ) | නිෂ්පාදනය කරනු ලබන සෑම බීඩියක් සහ සුරුට්ටුවක් සඳහා බද්දක් පැනවීම, භාවිතා කරනු ලබන බීඩි / සුරුට්ටු දුම්කොළ අමුද්‍රව්‍ය ප්‍රමාණය මත බද්දක් පැනවීමට සහ දුම්කොළ මෙන්ම නිෂ්පාදිත බීඩි / සුරුට්ටු ප්‍රවාහන අවසර පත්‍රයක් හඳුන්වාදීමට නියමයන් ඇතුලත් කරමින් 1625/1 හා 2009 ඔක්තෝම්බර් 26 දිනැති "2009 අංක 1 දරන දුම්කොළ බදු (සාමාන්‍ය) නියෝග" නැමති අති විශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කර 2018 ජුලි 05 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. නව සංශෝධනයක් සිදු කිරීම සඳහා 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත සංශෝධනය කලයුතු බවත් මේ සම්බන්ධයෙන් සංශෝධනය කිරීමේ කටයුතු සිදුවෙමින් පවතින බවත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා තිබුණි. 2019 අගෝස්තු 26 දිනැති සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අංක ED/2019 දරන ලිපිය මගින් දුම්කොළ නිෂ්පාදන සඳහා වන බදු සම්බන්ධයෙන් යෝජනා මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබුණද මේ දක්වාත් එහි ප්‍රගතියක් වාර්තා නොවිණි. | අදහස් දක්වා නොමැත. | අවශ්‍ය ප්‍රතිපාදන සැළසෙන පරිදි අදාළ සංශෝධන කටයුතු කඩිනමින් කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

**2.2 වියදම් කළමනාකරණය**

-------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා රු.33,000,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් එකතුව රු. 28,919,335 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 06 ත් සියයට 28 ත් අතර පරාසයක පැවතුණි. | 2021 වර්ෂය පුරාවට රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය අවස්ථානුකූල පරිදි වරින් වර වසා දැමීම, නිලධාරීන් සේවයට වාර්තා කිරීම අවම වීම, මිල දී ගැනීමේ කටයුතු සැලසුම් කල පරිදි සිදු කිරීමට නොහැකි වීම සහ නඩත්තු කටයුතු සැලසුම් | මු.රෙ. 127 (4) සහ (5) වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කල පරිදි සිදු නොවීම මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | |
| (ආ) මූලධන වැය විෂයයන් 04 ක් සඳහා රු 45,200,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් එකතුව රු. 37,631,029 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් සියයට 20 ත් අතර පරාසයක පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි ගොඩනැගිලි නඩත්තු කටයුතු සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම් හා නඩත්තු කටයුතු සිදු කිරීමට නොහැකි වීමෙන් එම වැය ශීර්ෂයන් යටතේ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | එම |
| (ඇ) 248-1-1-0-2104(59) ගොඩනැගිලි ඉදිකිරීම් වැය විෂය යටතේ රු. 200,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වාත් එම ප්‍රතිපාදන නිසිලෙස අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි. මු.රෙ. 66 යටතේ රු. 14,200,000 ක් වෙනත් විෂයකට 2021 ඔක්තෝම්බර් මාසය තුළදී මාරු කර තිබුණ අතර අවස්ථා දෙකකදී එකතුව රු. 152,000,000 ක ප්‍රතිපාදන නැවත පවරා දී තිබුණි. මේ අනුව සැලසුම් කළ ප්‍රාදේශිය කාර්යාල 08 ක ඉදිකිරීම් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක වී නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම සහ වරින් වර රට වසා දැමීම නිසා සැලසුම් කල පරිදි කාර්යයන් සිදු කිරීමට නොහැකි වීම සහ සමස්ථ ඉදිකිරීම් කර්මාන්තය පුරා ඇතිවූ අමුද්‍රව්‍ය හිඟ වීම හේතුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ පරිදි සිදුකර ගැනීමට නොහැකි වීම යන හේතු බලපා තිබුණි. | එම |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මිය ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු. 587,077 ක් වු අතර ඉන් එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 238,110 ක ණය ශේෂයක් වසර 2-3 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි. | එක් නිලධාරියකුගේ ණය ශේෂය රු. 208,360 ක් 2022 මැයි මස මරණ පාරිතෝසිකයෙන් අයකරගෙන ඇත. ඉතිරි හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 4 වගන්තිය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 අයවැය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සේවයෙන් පහකල, ඉල්ලා අස් වූ සහ සේවය අතහැර ගිය නිලධාරින් 10 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 1,296,611 ක ශේෂයක් පැවති අතර ඉන් නිලධාරින් 05 දෙනෙකුගෙන් එකතුව රු. 488,127 ක ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | -එම- |
| (ඇ) | විශ්‍රාම ගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් මාස 3-12 ත් අතර කාලයක සිට රු. 1,066,723 ක ණය ශේෂයක් හිඟව පැවතුණි. | නිලධාරීන් 07 දෙනෙකුගේ ණය ශේෂය රු. 668,436 ක් 2022 මැයි මස වන විට අයකරගෙන පැවති අතර, ඉතිරි ණය ශේෂයද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | -එම- |
| (ඈ) | වැඩ තහනමට ලක්වූ නිලධාරින් 17 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.2,077,880 කි. ඉන් නිලධාරින් 02 දෙනෙකුගෙන් එකතුව රු. 140,202 ක ණය ශේෂයක් වසර 5 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | -එම- |

**2.4 තැන්පත් ශේෂයන්**

--------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ තැන්පතු ගිණුම් 03 වසර 2 ක් ඉක්ම වූ එකතුව වූ රු. 854,211 ක් වූ තැන්පතු 10 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මු.රෙ. 571(3) ප්‍රකාරව අදාල විස්තර ලැබෙන තෙක් අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල්, ඉකුත් වූ තැන්පතු වශයෙන් සළකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථානෝචිත පරිදි, අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැරකළ යුතු අතර නැතහොත් හැකි ඉක්මණින් ආපසු ගෙවිය යුතු වුවත් අංක 6000-0-0-18-0-119 දරන තැන්පතු ගිණුමේ එසේ කටයුතු නොකල රු. 80,000 ක් වූ තැන්පතු 10 ක් විය. | -එම- | -එම- |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මත්පැන් නිෂ්පාදනාගාර, ස්කාගාර හා අනෙකුත් බලපත්‍ර ආයතන විසින් බැංකු මගින් බදු ගෙවීම් සිදු කිරීමේදී ගණුදෙනුකරු හඳුනාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පැවතියද එහි කටයුතු අවසන් වී නොතිබුණි. ඒ හේතුවෙන් බැංකු සැසඳුම් ප්‍රකාශය තුල හඳුනානොගත් ලැබීම් අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය විය. | ලංකා බැංකුව සමඟ සම්බන්ධ වී දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීම සඳහා බැංකු තැන්පතු පත්‍රිකාවක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවති. | බදු ගෙවීම් සිදු කිරීමේදී ගණුදෙනුකරු හඳුනාගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) | අංක 7041628 දරන බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසානයට මාස 03 ඉක්මවූ එකතුව රු. 2,552,867 ක් වූ හඳුනානොගත් ලැබීම් 30 ක් පැවති අතර ඉන් එකතුව රු. 1,346,985 ක් වූ ලැබීම් 17 ක් 2022 ජුනි 30 දිනට ඉදිරිපත් කළ බැංකු සැසඳුමේ ද පැවතුණි. | මේ වන විට ලැබීම් 7 ක් හඳුනාගෙන ඇති අතර ඉතිරි ලැබීම් කඩිනමින් හඳුනාගැනීමට කටයුතු කරමින් පවති. | කඩිනමින් ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | අංක 7041629 දරන බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසානයට මාස 03 ඉක්මවූ එකතුව රු. 158,066 ක් වූ හඳුනානොගත් ලැබීම් 12 කින් එකතුව රු. 64,211 ක් වූ ලැබීම් 09 ක් 2022 ජුනි 30 දිනට ඉදිරිපත් කළ බැංකු සැසඳුමේ පැවතුණි. | මේ වන විට ලැබීම් 3 ක් හඳුනාගෙන ඇති අතර ඉතිරි ලැබීම් කඩිනමින් හඳුනාගැනීමට කටයුතු කරමින් පවති. | -එම- |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | අලාභ හානි පිළිබඳව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයේ නම් මුදල් | CAR – 0183 අංක දරණ මෝටර් රථයේ පොලිස් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | මු.රෙ.104(4) | රෙගුලාසි 104(07) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක්ද, මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතු වුවත් එකතුව රු. 850,318 ක් පාඩු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු සිදුකර නොමැති අවස්ථා 02 ක් නිරීක්ෂණය විය. | වාර්ථාව මේ වන තෙක් ලැබී නොමැත. CAE - 0599 අංක දරණ මෝටර් රථයේ අනතුර සම්බන්ධයෙන් නැවත පරීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කෙරේ. | |
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනය | සමාලෝචිත වර්ෂය සඳහා ස්කාගාර, බෝතල් රා නිෂ්පාදනාගාර, පානිය හා පානීය නොවන ස්පිතු ආනයනය සහ විදේශ මත්පැන් ආනයනය ආදී ආදායම් ප්‍රභවයන් සඳහා මාසික ඉලක්ක, එම ඉලක්ක ලගා කරගැනීමට ගන්නා ක්‍රියාමාර්ග, එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මැනීම සඳහා වූ දර්ශක ඇතුලත් ආදායම් අයකර ගැනීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කර නොතිබුණි. | ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී මාසික ඉලක්ක එම ඉලක්ක ලඟා කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග ප්‍රගතිය මැනීම සඳහා වූ දර්ශක ඇතුළත් කෙරේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් අයකර ගැනීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 9 ඡේදය, මු.රෙ.31, මු.රෙ.880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | රජයේ මුදල් පිළිබඳ භාරකාරිත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරී ලෙස සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම ඇප තබන බවට වග බලාගත යුතු බව දක්වා තිබුණද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් එලෙස ඇප ලබාගෙන තිබුණේ නිලධාරින් දෙදෙනෙකුගෙන් පමණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හදුනා ගෙන ඇති අතර ඇප තැබීමේ කටයුතු සිදු කෙරෙමින් පවති. | ඇප ආඥා පනත,මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතුය. |

## 2.7 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සුරාබදු දෙපාර්තමේන්තුවේ අවසර පත්‍රයක් නොමැතිව ආයතන 08 ක් විසින් පානීය නොවන ස්ප්‍රීතු ආනයන කල අවස්ථා 10 ක් හා අනුමැතිය ලබා ගැනීමට පෙර ස්ප්‍රීතු තොග නැව් ගත කල අවස්ථා 17ක්ද නිරික්ෂනය විය. එහෙත් මෙම සියලුම ආනයනයන් සඳහා වූ කාර්මික අපරාධ | බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩකරමින් පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කිරීම සම්බන්ධනේ කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කර ඒ සඳහා සමථ | අදාළ සුරාබදු නිවේදනයෙහි 3(i) වගන්තිය අනුව කොන්දේසි කඩකලහොත් සුරාබදු ආඥාපනතේ 56 හෝ 48 යටතේ කටයුතු |

| | | |
|---|---|---|
| වාර්තාවලට අදාල දඩමුදල නියම කිරීමෙන් පසු අවසර පත්‍ර නිකුත් කිරීමට සුරාබදු දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.<br>කෙසේ වුවද 2018 පෙබරවාරි 21 දිනැති අංක 07/2018 දරන පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සඳහා වූ සුරාබද්ද මැයෙන් වූ සුරාබදු නිවේදනයෙහි 3(i) වගන්තිය අනුව සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සුරාබදු ආඥා පනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තෙකුට තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරී බලය යටතේ හැර එහි I වන උපලේඛනයේ සඳහන් පානීය නොවන ස්ප්‍රීතු වර්ගයක් කිසිම තැනැත්තෙකු විසින් ආනයනය කිරීම, අපනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සන්තකයේ තබා ගැනීම, ගබඩා කිරීම, විකිණීම, ප්‍රවාහනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බව අවධාරණය කර තිබුණි. තවද එම වගන්ති හා කොන්දේසි කඩකලහොත් සුරාබදු ආඥාපනතේ 56 හෝ 48 යටතේ කටයුතු කලයුතු වුවද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර එම බහාලුම් නිදහස් කිරීමට කටයුතු කර ඇත. | කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පරිගණක මෘදුකාංග පද්ධතිය<br>දෙපාර්තමේන්තුවේ පරිගණක මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 10 ක අයවැය ප්‍රතිපාදන සලසා තිබුණද අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ඉන් රු. 536,800 ක් ප්‍රතිපාදන නැවත පවරා දී තිබූ අතර රු. 9,060,000 ක් වෙනත් වැයවිෂය සඳහා මු.රෙ 66 මගින් මාරු කිරීම් සිදු කර තිබුණි. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිලාභය අහිමි වී තිබුණි. | පිළිතුරු සපයා නැත. | පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළව රජයේ ගිණුම්කාරක සභාව විසින් ලබා දුන් නියෝග අනුව කටයුතු කර අපේක්ෂිත ප්‍රතිලාභය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කාර්යක්ෂම ආදායම් පරිපාලනය, සේවාදායකයන් සඳහා ඉහළපෙලේ සේවාවක් ලබාදීම, රාජ්‍ය ආයතන හා දත්ත හුවමාරු විධිමත් කිරීම හා මානව සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැපයුම්දාමයක් ක්‍රියාත්මක කිරීම ආදී අරමුණු ඉටුකිරීම සඳහා RASED නමින් නව ප්‍රතිසංස්කරණයෙන් යුතු පරිගණක තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැන්වීමේ කටයුතු 2020 දෙසැම්බර් සිට ආරම්භකර තිබුණි. ඒ සම්බන්ධ පරීක්ෂාවේදී මොඩියුලර් (උපක්‍රියාවන්) 06 ක් යටතේ අවශ්‍යතා පිරිවිතර කෙටුම්පත් සකස්කර තිබුණද තවදුරටත් මොඩියුලර් 11 ක් යටතේ සවිස්තරාත්මක අවශ්‍යතා පිරිවිතර සකස් කිරීම ප්‍රමාද වී තිබුණි. තවද අමාත්‍යාංශයේ විශේෂඥ සේවාව අඛණ්ඩව නොලැබීම සහ යෝජිත උපදේශන සේවාවට අදාළ මූල්‍යමය යෝජනා සඳහා වූ අනුමැතිය ලබාගැනීමට ප්‍රමාද වීම ආදී හේතූන් ද එහි කටයුතු ප්‍රමාදවීමට බලපා තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ තොරතුරු විශේෂඥ සේවාව අඛණ්ඩව නොලැබීම, සවිස්තරාත්මක අවශ්‍යතා පිරිවිතර ලේඛනය සකස් කිරීමේ කටයුතු පවතින වර්තමාන අර්බුද මධ්‍යයේ සිදුකරමින් පැවතීම, මූල්‍යමය යෝජනාවලිය හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම කල් දැමීමට සිදුවීම. ආදි හේතූන් නිසා කටයුතු ප්‍රමාද වීම. | ඒකාබද්ධ පරිගණක දත්ත පද්ධතිය පරිගණක මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාළව රජයේ ගිණුම්කාරක සභාව විසින් ලබා දුන් නියෝග අනුව කටයුතු කර අපේක්ෂිත ප්‍රතිලාභය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | තවද ඒකාබද්ධ පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු පරීක්ෂාවේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ දත්ත හුවමාරුව 2021 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක වුවද අවබෝධතා ගිවිසුම පිටපතක් විගණනයට ඉදිරිපත් නොවූ අතර රේගු දෙපාර්තමේන්තුව අතර දත්ත හුවමාරුව අදාල දත්ත තොරතුරු හෙළිදරව් නොකිරීමේ ගිවිසුම 2021 ජූලි මස සිට ක්‍රියාත්මකව පැවතිණි. එහි පිටපතක් ද විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම දත්ත හුවමරු පහසුකම් යටතේ ඒකාබද්ධ පද්ධති මගින් තොරතුරු හුවමාරුව සිදුවන බව ලේඛණ මඟින් තහවුරු නොවුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමඟ දත්ත හුවමාරු කර ගැනිමට අවතීර්ණ වී ඇත. ඒ සඳහා අවශ්‍ය ගිවිසුම් ගත වීමට ක්‍රියා කරමින් පවති.<br>රේගු දෙපාර්තමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව අතර දත්ත හුවමාරුව සාර්ථකව සිදු කරමින් පවතී. | -එම- |
| (ඈ) | අංක 2155/19 දරන 2019 දෙසැම්බර් 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ පල වූ අංක 10/2019 දරන සුරාබදු නිවේදනයේ සඳහන්, ස්වභාවය වෙනස් නොකරන ලද පානීය සහ විකිණීම සඳහා අදහස් කළ බෝතල්ගත කරන ලද මත්පැන් අපනයනය මත සුරාබදු අවකරනය කිරීම සම්බන්ධ තොරතුරු ගිණුම් අංශයේ ලේඛණගත කර යාවත්කාලීනව පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ | අමාත්‍යාංශයේ උපදෙස් ලබාදෙන මෙන් ඉල්ලීමක් කර ඇත. එකී උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

මත්පැන් නිෂ්පාදන ආයතන 05 ක් විසින් එලෙස අපනයන කළ අවස්ථා 26 කදී මත්පැන් ලීටර් 11,173,738 ක් සඳහා රු. 3,689,638,848 ක සුරාබදු මුදලක් අවකරණය කර තිබුණි.

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ආරක්ෂිත ස්ටිකර් කළමණාකරණ පද්ධතිය**<br>බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය අවම කිරීම, සුරාබදු ආදායම තව දුරටත් සුරක්ෂිත කිරීම සහ ව්‍යාජ මත්පැන් වැලැක්වීම මූලික අරමුණ කරගෙන ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට 2017 ඔක්තෝම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩලය අනුමැතිය අනුව පද්ධතිය ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉන්දියානු සමාගමකට පිරිනමා 2018 සැප්තැම්බර් 21 දින සමාගම සමඟ ද්වි පාර්ශ්වික ගිවිසුම්ගතවී තිබුණි. ඒ යටතේ මෙම ව්‍යාපෘතිය වසර 05ක් දක්වා ක්‍රියාත්මක කිරීමටත් මාසිකව මිලියන 32ක අවම ස්ටිකර් ප්‍රමාණයක් උපදේශක සමාගමෙන් මිලදී ගැනීමටත් තිරණය කර තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත නෛතික බලගැන්වීම ලබා ගැනීම සඳහා සුරාබදු ආඥා පනත 2019 සැප්තැම්බර් 03 දින සිට බලාත්මක වන පරිදි සංශෝධනය කර තිබුණි. ආනයනික මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකර් යෙදීම 2019 ජූලි 20 දින සිට ක්‍රියාත්මකව පැවතිණි.<br>දේශීය නිෂ්පාදිත මත්පැන් සඳහා ආරක්ෂිත ස්ටිකර් ඇලවීම 2019 අගෝස්තු 20 දින සිට ආරම්භ කල යුතුව තිබුණද පහත සඳහන් කරුණු හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ප්‍රමාද වී තිබුණි.<br>(අ) නිෂ්පාදන වේගය හා ධාරිතාව වැඩි ස්වයංක්‍රීය බෝතල් ගත කිරීමේ යන්ත්‍ර භාවිතා කරන මත්පැන් නිෂ්පාදන සමාගම් කිහිපයකට ස්වයංක්‍රීය මත්පැන් බෝතල්ගත කිරීමේ යන්ත්‍ර වලට සරිලන අයුරින් ස්ටිකර් ඇලවීමේ යන්ත්‍ර සොයාගත නොහැකි බවට දැක්වූ ප්‍රායෝගික ගැටළුව. | 2022 ජනවාරි 03 දේශිය මත්පැන් මත ආරක්ෂිත සළකුණු යෙදීම ආරම්භ කර ඇත. දේශිය මත්පැන් නිෂ්පාදන ආයතන 06 ක් ඩිජිටල් සළකුණුද නිෂ්පාදන ආයතන 59 ක් ස්ටිකර් ඇලවීමේ ක්‍රමවේදයද භාවිතාකරනු ලබයි. සුවිශේෂී කරුණු මත එක් නිෂ්පාදන ආයතනයක් පමණක් ඩිජිටල් සහ ස්ටිකර් යන ක්‍රමවේදය දෙකම භාවිතා කර ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට කඩිනමින් කටයුතු කලයුතුය |

(ආ) ස්ටිකර් ක්‍රමය සමඟින් ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීමට අදාලව පවතින නීතිමය හා තාක්ෂණික ගැටළු හඳුනාගනිමින් ඩිජිටල් තාක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව සොයා බැලීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කිරීමට සිදුවීම.

(ඇ) නිෂ්පාදනාගාර කිහිපයක ඩිජිටල් තාක්ෂණ ක්‍රමවේදය අත්හදා බැලීමේ පෙරහුරු සිදුකර තිබීම.

(ඈ) බලපත්‍රධාරි නිෂ්පාදකයාගේ ඉල්ලීම අනුව ඩිජිටල් ප්‍රින්ට් ක්‍රමය හෝ ස්ටිකර් ඇලවීම යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් භාවිතා කිරීමට අදාල රීති සංශෝධනය කිරීම.

(ඉ) උපදේශන සමාගමේ ඉංජිනේරුවන් සමඟ මත්පැන් නිෂ්පාදනාගාර නිරීක්ෂණය කිරීම හා නිෂ්පාදනාගාරවල පිහිටිය යුතු යටිතල පහසුකම් පිළිබඳ වාර්තා සැකසීම පිළිබඳ මත්පැන් නිෂ්පාදකයින් දැනුවත් කිරීමේ ප්‍රමාදය.

(ඊ) උපදේශන සමාගම ව්‍යාපෘතියට අදාල ඩිජිටල් සලකුණු ඇලවීමේ යන්ත්‍ර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් සපයා නොතිබීම.

(උ) ගිවිසගත් විදේශීය උපදේශක සමාගම විසින් මෘදුකාංග සංවර්ධනය හා ව්‍යාපෘතියට අදාල උපාංග ඇතුළු අනෙකුත් කාර්යයන්ට අදාලව සැලසුම්කල කාර්යයන් සමාලෝචිත වර්ෂය දක්වාම දිගින් දිගටම ප්‍රමාද කර තිබීම.

මේ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවීම තවදුරටත් ප්‍රමාද වී තිබුණි.

### 3.3 ප්‍රසම්පාදනයන්

-------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මේ පරාස 11 ක් යටතේ එක් කාණ්ඩයකින් උපකරණ 20 බැගින් මත්පැන් වල සැර බැලීමේ උපකරණ 220 ක් මිළදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු වල පැවති ප්‍රමාදයන් මත සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් මිලදි ගැනීම සිදු වී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා පරාස 11 ක් යටතේ එක් කාණ්ඩයකින් උපකරණ 20 බැගින් හයිඩ්‍රෝමීටර් 220ක් මිල දී ගැනීම සඳහා 2020 වසරේ පෙබරවාරි මාසයේ දී අනුමැතිය ලබාගෙන මිල ගණන් කැඳවා ඇති අතර ඒ සඳහා ලැබී ඇති මිල ගණන් ඉදිරිපත් කල ආයතන වෙතින් ඊට අදාල ආදර්ශ භාණ්ඩ (Sample) ඉල්ලා ඇත. නමුත් එම ආදර්ශ භාණ්ඩ ලබා දීමට එම ආයතන සතුව මෙම | ප්‍රසම්පාදන කටයුතු විධිමත් සැලැස්මකට අනුව සිදුකළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | උපකරණ නොතිබීම මෙන්ම 2020 වසරේ ලොව පුරා සිසුයෙන් පැතිරි ගිය කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් ආනයනය කර හෝ ලබාදීමට නොහැකි බවද එම ආයතන විසින් දන්වන ලදී. එම හේතුවෙන් 2020 වසරේදි එම භාණ්ඩ මිල දී ගැනීමට හැකියාවක් නොවීය.<br>හයිඩ්‍රොමීටර් වෙළඳපොල තුල හිඟයක් පවතින බැවින් 2021 වසරේ දී එම උපකරණ මිල දී ගැනීමේදී වර්තමානයේදී මෙම දෙපර්තමේන්තුවට වඩාත් ගැලපෙන අයුරින් මිල දී ගැනීම සුදුසු බව සහ ඒවායේ පිරිවිතර නැවත සකස් කිරීම සුදුසු බව යෝජනා වී ඇත. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපර්තමේන්තුවේ නිලධාරියෙකු ඇතුලත් කරමින් පත්කරන ලද කමිටුවක් විසින් අදාල පිරිවිතර සකස් කර ලබා දී ඇත. මේ සඳහා 2021 වසරේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම මිල දී ගැනීම සුරාබදු ත්‍යාග අරමුදලේ මුදල් උපයෝගී කර ගනිමින් මෙම වසරේ දී මිල දී ගැනීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | |

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සුරාබදු කාර්යාලය පවත්වාගෙනයන ඉඩම් 17 කට අදාළව නිරවුල් ඔප්පු ලබා ගැනීමේ හෝ රජයේ ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදීත් අවසන් වී නොතිබීම. | දෙපාර්තමේන්තුව සතු ඉඩම් 42 න් මේ වන විට 27 ක් පවරා ගෙන ඇති අතර තවදුරටත් ඉඩම් 15 ක් පවරා ගැනීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවති. | නිරවුල් ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 අනාර්ථික ගනුදෙනු**

**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුලතිව් හා පේදුරුතුඩුව කාර්යාලවල ඉදිකිරීම් ප්‍රමාදයන්ද සහ හැටන්, යාපනය ඉදිකිරීම් ස්ථාන පිළිවෙලින් අනාරක්ෂිතවීම හා යෝග්‍ය නොවීම | යාපනය සුරාබදු කාර්යාලය ඉදි කිරීමට යෝජිතව තිබූ ඉඩම අනාරක්ෂිත වීම මත නව ගොඩනැගිල්ල ඉදි කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. | සැළසුම් කළ පරිදි ඉදිකිරීම් ප්‍රමාදයන් නොමැතිව නිම කරවා ගැනීමටත් වර්ෂයේ |

| | | |
|---|---|---|
| හේතුවෙන් අතහැර දැමීමට සිදු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමට නොහැකිවීම මත තවදුරටත් එම කාර්යාල කුලී පදනම මත පවත්වා ගෙනයාම වෙනුවෙන් රු. 2,802,000 ක් වර්ෂය තුළදී ගෙවීමට සිදු වී තිබුණි. | හැටන් ඉඩම අධික කලු ගල් බහුල ප්‍රදේශයක් වීම හේතුවෙන් භූමිය සැකසීමට අධික පිරිවැයක් දැරීමට හේතු වන බැවින් ඉදි කිරීම් කටයුතු සිදු කිරීම සුදුසු නොවන බවත් මේ සඳහා වෙනත් ඉඩමක් සොයා ගැනීම සුදුසු බවත් නිර්දේශ කොට ඇත.<br>මුලතිව් ගොඩනැගිල්ල 2022 අප්‍රේල් 09 වන දින විවෘත කොට ඇත.<br>පේදුරුතුඩුව කාර්යාල සංකීර්ණය ඉදි කිරීමේ කටයුතු දිගින් දිගටම ප්‍රමාද වී ඇත. | ප්‍රතිපාදන උපයෝජනයට පියවර ගත යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් අතුරින් රාජ්‍ය ආදායමට ඉතා අඩු දායකත්වයක් දක්වනු ලබන නිෂ්පාදනාගාර සමාගම් 6 ක් පිළිබඳව සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සිදු කළ කාර්යසාධන විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු ඇතුලත් වාර්තාවේ කරුණු 19 ක් මගින් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවධානය යොමු කළ යුතු අතර ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය විගණකාධිපති වෙත වාර්තා කල යුතුය. |

(ආ) සිදු කර ඇති අපරාධ ග්‍රහණයන්

සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉටුකරගැනීම සඳහා පැවරී ඇති පරමාර්ථ හා කාර්යන්ට ආදලව 2021 වර්ෂය සහ ඉකුත් වර්ෂ හතරක සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ග්‍රහණය (වැටලීම්) කරන ලද අපරාධ පිළිබඳ විස්තර පහත පරිදි විය.

| පනත සඳහා යොමුව | සිදුකරන ලද අපරාධ ග්‍රහණ සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
| සුරාබදු ආඥා පනත | 31952 | 31916 | 34111 | 36884 | 35488 |
| විෂ වර්ග, අබිං හා අන්තරායකර ආඥා පනත | 4278 | 4988 | 8243 | 6047 | 6103 |
| දුම්කොළ බදු පනත | 2576 | 2253 | 3602 | 3479 | 2485 |
| දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත | 302 | 466 | 1435 | 2902 | 4406 |
| මුළු ග්‍රහණ සංඛ්‍යාව | 39108 | 39623 | 47391 | 49312 | 48482 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ඉහත තොරතුරු අනුව 2017 වර්ෂයට සපේක්ෂව 2018 වර්ෂයේ සමස්ථ ග්‍රහණය කිරීම් 830 කින් හෙවත් සියයට 2 ක ආසන්න ප්‍රතිශතයකින් වැඩි වී තිබූ අතර 2019 වර්ෂයට සපේක්ෂව 2020 සහ 2021 වර්ෂය වල සමස්ථ ග්‍රහණය කිරීම් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය. | 2017 සිට 2019 වසර දක්වා ආසන්න වශයෙන් සමාන වූ අපරාධ ග්‍රහණ සංඛ්‍යා සිදුකර ඇති අතර 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේ දී වැඩි ග්‍රහණ සංඛ්‍යාවක් සිදුකර ඇත. තවද, 2020 හා 2021 වර්ෂ වල ග්‍රහණ සංඛ්‍යාවන් අඩුවී ඇත්තේ එම කාල සීමාවන් තුල දී දිවයින පුරා පැවති සුරාබදු නිලධාරින්ගේ පාලනයෙන් තොර වූ අධි වසංගත හා වෙනත් තත්වයන් හේතුවෙන් නිරීක්ෂණ හා එකඟ නොවෙමි. | අදාළ පනත් අනුව පැවරී ඇති කාර්යයභාරය ඉටු කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැළස්මේ දක්වා ඇති දැක්ම, මෙහෙවර, පරමාර්ථයන් හා කාර්යයභාරය ඉටුවන කළ යුතුය. |
| (ii) 2021 වර්ෂයේ සමස්ථ ග්‍රහණ වලින් සියයට 81.7ක් සුරාබදු ආඥා පනත යටතේ නියෝජනය වන අතර සියයට 18.3ක් විෂ වර්ග, අබිං හා අන්තරායකර ඖෂධ ආඥා පනත, දුම්කොළ බදු පනත, දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කර තිබූ අපරාධ ග්‍රහණ නියෝජනය වේ. එය පිළිවෙලින් සියයට 11, සියයට 6.6, හා සියයට 0.7 ක අගයක පැවතුණි. | නිරීක්ෂණයන්හි දක්වා ඇති සංඛ්‍යා ලේඛන හා එකඟ වෙමි. අදාළ අපරාධ ඒවාට පසුබිම් වූ නෛතික අනපනත් යටතේ වර්ගීකරණය කිරීම සංඛ්‍යා ලේඛනමය වශයෙන් ප්‍රයෝජනවත් විය හැකි වුවද අපරාධ ග්‍රහණ ක්‍රියාවලියේදී නිලධාරින් ක්‍රියාත්මක වනු ලබන්නේ ලැබෙන තොරතුරු මත හෙයින් ද එම තොරතුරු වල ස්වභාවය නිලධාරින්ගේ පාලනයෙන් තොර හෙයින් ද ඒවා පාදක කර ගනිමින් සිදුකර ඇති අපරාධ වාර්තා ග්‍රහණ වල වර්ගීකරණය පුරෝකතනය කිරීමට වේ. | කාර්යයසාධන අඩු වී ඇති ක්ෂේත්‍ර සඳහා නියාමන ක්‍රමවේදයන් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) සිදු කර ඇති කාර්මික අපරාධ ග්‍රහණයන් | | |
| සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 කට අදාලව කාර්මික අපරාධ ග්‍රහණ සම්බන්ධව සුරාබදු දෙපාර්තමේන්තුවේ නිති ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ග්‍රහණ සම්බන්ධ තොරතුරු අනුව 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැටලීම් ඉලක්ක ලබාදීම් වාර්ෂිකව ක්‍රමයෙන් අඩු වී තිබුණි. තවද ඉලක්කගත ග්‍රහනවලට සාපේක්ෂව සිදු කළ ග්‍රහණ ප්‍රමාණය වැඩි වී තිබුණද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා | නොවිසඳුනු කාර්මික අපරාධ වාර්තා<br>කාර්මික අපරාධ වාර්තාවක් විසඳුණු කාර්මික අපරාධ වාර්තාවක් බවට පත්වන්නේ ඒ මත සමථ ගාස්තු පනවා එය ගෙවා අවසන් විමෙනි. බොහෝවිට කාර්මික අපරාධ මත පනවනු ලබන සමථ ගාස්තු ගෙවීම සඳහා | 2011 අගෝස්තු 11 දිනැති අංක 03/2011 දරන සුරාබදු චක්‍රලේඛය ප්‍රකාරව වර්ගීකරණ 09 ක් යටතේ වූ ප්‍රධාන ගණයේ කොන්දේසි කඩකිරීම්වලින් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් අවම කිරීම |

| | | | |
|---|---|---|---|
| | සිදුකළ ග්‍රහණ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී තිබුණි. 2021 වර්ෂයේ තත්‍ය ග්‍රහණ සංඛ්‍යාව 4098 ක් වුවද මුලින් සැලසුම් කළ ඉලක්කගත ග්‍රහන සංඛ්‍යාව 3428 ක සිට 2571 දක්වා 857 කින් හෙවත් සියයට 25 කින් අඩු කර තිබුණු බව නිරීක්ෂණය විය. | බලපත්‍රධාරින් වසර අග දක්වා කල් ගන්නා අතර, එවිට නෛතික විධිවිධාන යටතේ 10 % ක ප්‍රමාද ගාස්තුවක් සමඟ එම සමථ ගාස්තු ගෙවා වසර අවසානයේ දී සිය බලපත්‍ර ඊළග වසර සඳහා අළුත් කරවා ගැනිම සිදු කෙරේ. | සඳහා බලපත්‍රලත් ස්ථාන පිළිබඳ අඛණ්ඩව විධිමත් පරීක්ෂාවකට ලක් කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | දේශිය වෙළෙඳපොළේ ආනයනය කරනු ලබන ආනයනික විදේශ මත්පැන්වලට අදාළව සුරාබදු ර.බී. 03 බලපත්‍රලත් ස්ථාන වලින් 2021 පෙබරවාරි 19 දිනැති අංක 04/2021 දරන සුරාබදු චක්‍රලේඛනය අනුව අර්ධවාර්ෂික වශයෙන් මත්පැන් වර්ග වලින් නිදර්ශක ලබාගෙන රසපරීක්ෂක වෙත යවා වාර්තා ලබාගෙන ප්‍රමිතිය හා ගුණත්වය තහවුරුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි වාර්තා සඳහා නිදර්ශක ලබා ගෙන තිබුණේ ස්ථාන **6**ක අවස්ථා 53 කදී පමණි. | අදහස් දක්වා නොමැත. | ආනයනික විදේශ මත්පැන්වලට අදාළව ප්‍රමිතීන් හා පිරිවිතරයන්ට අනුකූලතාවය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට වෙත පැවරී ඇති වගකීම ඉටුවන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාරවිල සුරාබදු බලප්‍රදේශයේ පිහිටි ස්කාගාරයකින් සමාලෝචිත වර්ෂයේ මුල් අර්ධ වර්ෂයට අදාළව ස්ප්‍රීතු දෙවරක් පෙරීමේදී ඉඩදෙන සීමාව ඉක්මවා සිදු වී තිබු අපතය සඳහා අයවිය යුතු රු. 387,990 ක මුදලක් ද අයකර ගෙන නොතිබුණි. තවද නිෂ්පාදනාගාර සහ ස්කාගාර වලින් මත්පැන් හා ස්ප්‍රීතු නිෂ්පාදන ක්‍රියාවලියේදී සිදුවන අපතයන් සඳහා ඉඩදෙන සීමාව ඉක්මවා සිදුවන අපතයන් සඳහා සුරාබදු මුදල් අයකරගැනීම සම්බන්ධ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන බවට විගණනයට තහවුරු නොවුණි. | මේ දක්වා වු කාල සීමාවේදී නිෂ්පාදන අපතයක් සඳහා අයකළ යුතු බදු මුදල් අය කිරීම් මගහැරී ඇත්දැයි පරීක්ෂා කොට ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කෙරේ. | මත්පැන් හා ස්ප්‍රීතු නිෂ්පාදනයේදී අපතයන් සඳහා ඉඩදෙන සීමාව ඉක්මවා සිදුවන අපතයන් සඳහා සුරාබදු මුදල් අයකරගැනීම සම්බන්ධ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් ඉලක්ක පිළියල කිරීමේදී ක්‍රියාත්මක මට්ටමේ නොමැති නිෂ්පාදනාගාර 04 කින් එකතුව රු.7,001,935,186 ක බදු ආදායමක් අපේක්ෂා කර තිබුණද එම ආදායම ලැබී නොතිබුණි. | නැවත සමාලෝචනය කිරීමෙන් පසු එම ඉලක්කයන් ඉවත් කර වෙනත් නිෂ්පාදනාගාර සමඟ ගැළපීමට කටයුතු කර ඇත. | නෛතික විධිවිධානයන් යටතේ ආදායම් රැස්කිරීමට අදාළ ආයතනවලින් පමණක් බදු අයකිරීම සම්බන්ධ ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |
| (උ) | සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ බලපත්‍රලත් නිෂ්පාදනාගාර 26 කින් ක්‍රියාත්මක වනු ලබන අතර එම නිෂ්පාදනාගාර විසින් 2021 වර්ෂයට අදාලව වාර්ෂිකව නිපදවනු ලබන මධ්‍යසාර නිෂ්පාදනයන් හා එමඟින් ආදායමට වන දායකත්වය සහ එක් එක් නිෂ්පාදන සමාගමේ වෙළඳපල කොටස පිළිබඳව දත්ත පරීක්ෂාවේදී නිරීක්ෂණය වුයේ සමාලෝචිත වර්ෂයේ | එක් එක් නිෂ්පාදන සමාගමේ වෙළඳපල කොටස අත්පත් කරගෙන ඇත්තේ සුරාබදු දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වු කරුණු මත වේ.<br>රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරිම සඳහා ගතයුතු සෑම පියවරක්ම | ආදායම්ගත දත්ත තොරතුරු විශ්ලේෂණාත්මකව විග්‍රහකිරීම මගින් රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරිම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් අතරින් සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 21 ක් හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදන සමාගම් 2 ක් පිළිවෙලින් මුළු ආදායමට සියයට 70.81 ක හා සියයට 29.19 ක දායකත්වයක් ලබා දී ඇති බවයි. ක්‍රියාත්මක තත්වයේ පැවති සැර මත්පැන් නිෂ්පාදන සමාගම් 21 ක් අතුරින් මුලු ආදායමින් සියයට 64.6 ක දායකත්වයක් ලබා දී තිබුණේ සමාගම් 4 ක් පමණක් වූ අතර නිෂ්පාදන සමාගම් 3 ක දායකත්වය සියයට 3.9 ක පහළ අගයක් ගෙන තිබුණි. අනෙක් සමාගම් 12 හි දායකත්වය සියයට 1.8 ක මට්ටමක පැවතුණි. | ගෙන ඇත. | |
| (ඌ) | සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් බීඩි/සිගරට්/සුරුට්ටු සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික 774ක් නිකුත්කර තිබුණද 2022.03.31 දින වන විට ප්‍රවර්ථන වර්ෂය සඳහා ලියාපදිංචිය අළුත්කරගෙන තිබූ ආයතන සංඛ්‍යාව 509ක් විය. ඒ අනුව අක්‍රීය තත්ත්වයේ පවතින ආයතන සංඛ්‍යාව 265ක් බවත්, මෙම ආයතන වලින් ලියාපදිංචි ගාස්තු, හිඟ ලියාපදිංචි ගාස්තු, අයදුම්පත්‍ර ගාස්තු හා මුද්දර බදු යන ආදායම් සුරාබදු දෙපාර්තමේන්තුවට අහිමි වී ඇති බවට නිරීක්ෂණය විය. | -එම- | ඒ අනුව අක්‍රීය තත්ත්වයේ පවතින ආයතන පිළිබඳව පසු විපරමක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව අරමුණු 15 කට අදාළව ලගා කරගත යුතු ඉලක්ක 37 කින් සමාලෝචිත වර්ෂය සඳහා අරමුණු 05 ක් යටතේ ඉලක්කයන් 07 ක් හඳුනාගෙන තිබුණි. එහි ඇතුලත් පරිසාරක හා සමාජීය ආරක්ෂණය සඳහා හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම සම්බන්ධයෙන් ගිණුම් කාරකසභා රැස්වීම්වලදීද අවධානය යොමු කර නියෝග ලබාදී තිබුණි. එහි වූ මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම, රසායනාගාරයක් ස්ථාපිත කිරීම හා වාර්ෂික සුරා කර්මාන්තයෙන් අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදන වන අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම හා ඒවා | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ 2030 හි දෙපාර්තමේන්තු ප්‍රධාන අරමුණු17 ප්‍රකාරව ඉන් අරමුණු 15 කට 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ඉලක්ක කළ ද දෙපාර්තමේන්තුවක් ලෙස එවන් විශාල අරමුණු ප්‍රමාණයක් දක්වා කටයුතු කිරීමේ දුෂ්කරතා නිසා 2021 ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේදී එම අරමුණු 5 ක් දක්වා ලගු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පහත සඳහන් තිරසාර | පරිසාරක හා සමාජීය ආරක්ෂණය සඳහා හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම සම්බන්ධයෙන් ගිණුම් කාරකසභා රැස්වීම්වලදී අවධානය යොමු කළ නියෝග ක්‍රියාත්මක කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ප්‍රතිචක්‍රීකරණය, නැවත භාවිතා කිරීම මගින් අඩු කිරීම ආදී ක්ෂේත්‍රයන්ට ආදාල අරමුණු ඉටුකිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැළස්මේ වු කාර්යයන් සඳහා නිශ්චිතවම ලහාකරගත් ප්‍රගතිය දැක්වෙන තොරතුරු විගණනයට වාර්තා නොවිණි. | සංවර්ධන අරමුණුවලට ප්‍රමුඛත්වය ලබා දීම හා එම අරමුණු 2021 හා 2022 වර්ෂයට ඉලක්ක කරගත් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ද සකස් කර ඇත. මේ වනවිට ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්යභාරය මෙම තිරසාර සංවර්ධන අරමුණු 5 ක් ඔස්සේ ක්‍රියාකිරීමට කටයුතු කර ඇත. | |

## 5. යහපාලනය
-------------------

### 5.1 අභ්‍යන්තර විගණනය
-------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන සැළස්ම මඟින් ක්ෂේත්‍ර 19 කට අදාළව විගණන වැඩසටහන් 10 ක් සැලසුම් කර තිබුණද ඉන් ක්ෂේත්‍ර 10 කට අදාළව අභ්‍යන්තර විගණන වැඩසටහන් 05 ක් මගින් විමසුම් 05 ක් නිකුත් කර තිබුණි. එම වාර්තා මගින් පෙන්වා දී තිබුණු පාලන ක්‍රමවේදයන්වල වූ අඩුපාඩු සඳහා කළමණාකරණය ගන්නා ලද ක්‍රියාමාර්ග විගණනයට වාර්තා නොවුණි. | අදහස් දක්වා නොමැත. | අවධානම් පාදක කරගත් මනාව සැලසුම් කල විගණන සැලැස්මක් මඟින් අභ්‍යන්තර විගණන ක්‍රියාත්මක විය යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ප්‍රධාන කාර්යාලය ඇතුළු දිවයින පුරා පිහිටි සහකාර සුරාබදු කාර්යාල 13 කින් සුරාබදු අධිකාරී කාර්යාල 30 කින් සුරාබදු ස්ථාන 56 කින් විශේෂ මෙහෙයුම් ඒකක 5 කින් හා මත්ද්‍රව්‍ය නීති ක්‍රියාත්මක කිරීමේ ඒකකයකින් සමන්විතව දීප ව්‍යාප්ත සේවාවක් ඉටු කරනු ලබයි. සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---:|---:|---:|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 68 | 32 | 36 |
| තෘතියික මට්ටම | 381 | 295 | 86 |
| ද්විතික මට්ටම | 1048 | 875 | 173 |
| ප්‍රාථමික මට්ටම | 142 | 86 | 57 |
| එකතුව | 1639 | 1288 | 352 |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරක, ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරක, සුරාබදු කොමසාරිස් තනතුරක, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 6ක, සහාකාර සුරාබදු කොමසාරිස් තනතුරු 4ක, සහ සුරාබදු අධිකාරී නතතුරු 20ක පුරප්පාඩු පැවතුණි. | අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරේ හා ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරේ දැනට වැඩ බැලීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇති අතර එම පුරප්පාඩු 02 පවති. සුරාබදු කොමසාරිස් තනතුරේ පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් නොමැත. නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 6 ක් පුරප්පාඩු වී පවතින අතර සුදුසුකම් ලත් නිලධාරීන් දෙදෙනෙකු සිටින නමුත් ඔවුන් ඒ සඳහා අයදුම් කර නොමැත. සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 4 ක් පුරප්පාඩුව පවති. එක් තනතුරක් සුරාබදු අධිකාරවරයකු සඳහා වෙන් කර ඇත. සුරාබදු අධිකාරි තනතුරු පුරප්පාඩු 21 කි. එයින් 11 දෙනෙකු සඳහා සම්මුඛ පරීක්ෂණ පවැත්වීමට නියමිත තවත් 8 දෙනෙකු විභාගය සඳහා අයදුම් කර ඇත. | ආයතනයේ කාර්යයභාරය ඉටු කිරීමට අවශ්‍යම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ මෙහෙවරට සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 36 ක සහ තෘතීය මට්ටමේ තනතුරු 86 ක පුරප්පාඩු පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු 36 පිරවීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති හෙයින් මෙම තනතුරු පුරප්පාඩු පිරවීම පිළිබඳව උපදෙස් ලබා දෙන ලෙස මගේ අංක ED/02/03/02/10 හා 2022.03.10 දිනැති ලිපියෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා ඇත. ඒ අනුව නියමිත බඳවා ගැනීමේ පටිපාටියේ සම්පූර්ණ කළ යුතු සේවා කාලය හැර අනෙක් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සේවා කාලය නොසලකා එක් අවස්ථාවකට පමණක් උසස් කිරීම සඳහා නිර්දේශ කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර එහි ප්‍රගතිය අනුව මෙම ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්පූර්ණ කල හැකිවනු ඇත.<br>එමෙන්ම තෘතික මට්මේ නිලධාරීන් ලෙස ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරු 18 දෙනෙකු උසස් කිරීම හා විවෘත පදනමින් සුරාබදු පරීක්ෂකවරු 37 දෙනෙකු බඳවා ගැනීම් සිදු කරන ලදි. | -එම- |
| (ඇ) | නිති නිලධාරී, සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ හා පරිපාලන නිලධාරී තනතුරු මෙතෙක් පිරවී නොතිබුණි. | නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා එම ලේඛණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.<br>පුරප්පාඩු පවතින සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) තනතුර සහ පරිපාලන නිලධාරී තනතුර සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් මගින් එකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | -එම- |